# ලංකාවේ වී ගොවිතැන දියුණුවට ඇති බාධා පිළිබඳ ඇතැම් කරුණු.

## *Some of the limiting Factors in the Improvement of Paddy Cultivation in Ceylon.*

---

" ලංකාවේ වී ගොවිතැනෙහි නියුක්තව සිටින ගොවියාට අධික ලාභ ලැබෙන ලෙස ගොවිතැන් කිරීමට බාධා ඇතිවෙන කරුණු " යන මාතෘකාව මේ වාක්‍යයට වඩා සුදුසු නමුත් එය ඉතා දීර්ඝනිසා නොයෙදූ වෙමි. නමුත් වී ගොවිතැන දියුණු වීමට අත්‍යාවශ්‍යක කාරණය නම් සියළු වියදම් හැර ගොවියාට ලාභ ලැබෙන විධාන යෙදීමවේ.

අවුරුදු පතා ලංකාවේ වී බුසල් 1300,0000ක් උපදවන්නේ වීනමුත් ඉන්දියාවෙන් එමෙන් දෙගුණයකටත් වඩා එනම් වී හෝ හාල් බුසල් 31000,000ක් ගෙන්වීම බොහෝදෙනාගේ සංවේගයට කාරණයක් වන්නේය. සුදුසු බිත්තරවී වලින් ගොවිතැන් කිරීමෙන් හා නවීන ගොවිතැන් ක්‍රම භාවිතාවටට පැමිණ වීමෙනුත් දැනට වඩා වී අධික ප්‍රමාණයක් ලැබිය හැකි වන්නේ වී නමුත් ලංකා වාසීන්ගේ ආහාරයට සෑහෙන පමණින් එය ලැබෙතැයි සිතීමට අවකාශයක් නැත්තේය. ජල සම්පාදන ක්‍රම අළුතෙන් ඇතිකිරීමෙන් හෝ දැනට තිබෙන ක්‍රම දියුණු කිරීමෙන් හෝ ඉඩම් වැඩි ප්‍රමාණයක් ගොවිතැන් කිරීමෙන් මේ දියුණුව ලබාගත හැකිවන්නේය. නමුත් මේ මාර්ගයෙන් කොපමණ ඉඩම් දියුණු කලහැකිදැයි ගණන් බලා නැත.

දැනට තිබෙන කුඹුරුවල ලාභ ලැබෙන අන්දමට ගොවිතැන් කිරීමට උවමණා කරුණු පමණක් මේ පත්‍රිකාවෙන් විස්තරකරනු ලැබේ. "ලාභ ලැබියහැකි" යන වචනය මා විසින් මෙහි යොදන ලද්දේ අධික වශයෙන් පෝර යෙදීමෙන් වියදම් වන ප්‍රමාණයට අස්වැන්න ලැබිය නොහැකි නිසාත් අධික අස්වැන්නක් බලාපොරොත්තුවෙන් බලගතු ලෙස ගොවිතැන් කිරීමෙන් ගොවියාට ඔහුගේ කෑම් බීම් ආදියෙන් සැප පහසුවක් නොලැබෙන නිසත්ය. මේ දියුණු ක්‍රම ගැණ කල්පනා කරනවිට ගොවියාගේ සැප පහසු ගැණත් නිතර සිතේ තබාගත යුතුයයි මා කියන්නේ මේ නිසාය.

ගිය අවුරුද්දේදී වී ගොවිතැන දියුණු කිරීමට කළයුතු වැඩ සම්බන්ධයෙන් මේ සභාව ඉදිරිපිටදී කථාවක් කිරීමට ඉඩ ලැබුණේය. මේ අවුරුද්දේදී මා විසින් විස්තර කරන්නේ වී ගොවිතැන දියුණු කිරීමට ඇති බාධාවල් සම්බන්ධයෙනි.

දියුණු කිරීමට කළයුතු වැඩ සහ බාධා පැමිණීමට ඇතිවන කරුණු පහත දක්වන ලෙස බෙදිය හැකිවේ.

දියුණු කිරීමට උවමණා කරුණු.

(1) බිත්තර වී සහ බිත්තර වී සැපයීම.
(2) ගොවිතැන් ක්‍රම.
(3) කුඹුරුවල ප්‍රමාණය වැඩිකිරීම.

බාධාවල්.

(1) කෘමි රෝග සහ පැළ රෝග.
(2) මුදල් ණයට ගැණීමේ ඇති පහසුකම්.
(3) අස්වැන්න විකිණීම.
(4) කාල ගුණය හා කුලි වැඩකරුවෝ.
(5) වී ගොවිතැනට ප්‍රදෙශ සීමා කිරීම.
(6) අඳ ක්‍රම.

ඉහත සඳහන් කරනලද ශිෂ්‍යයන්ට සමණක් සාකච්ඡාව සීමා කිරීම අවශ්‍ය නොවේ. එය නුපුළුවන් කර්තව්‍යයක්දවේ. දියුණු කිරීම සම්බන්ධයෙන් යට කියන ලද කරුණුවලට එකම බාධාවක් නොව නොයෙක් බාධාවල් ඇතිවිය හැක. කුඹුරකට උවමනා ඉඩමේ ප්‍රමාණය ගැණ සාකච්ඡාකරනවිට ඒ ගොවි තැනට සීමාකර තිබෙන ප්‍රදෙශ ගැණ සිතට ගතයුතුයි

**බිත්තර වී සහ බිත්තර වී සැපයීම**:—තෝරා ගන්න ලද බිත්තර වී වලින් ගොවිතැන් කිරීමෙන් වී ගොවිතැන දියුණුවන බව ප්‍රත්‍යක්‍ෂ කරුණකි. ගොවියාට එය වැඩි අමාරු කාරණයක් නොවන්නේය. ඒ සඳහා අමුතු වැඩ කිරීමට සිදුවන්නේ නැත සාමාන්‍යයෙන් අමතර වියදමක්ද නොවන්නේය. මේ විධියෙන් වී ගොවිතැනේ දියුණුවට බාධා පැමිණීමට ඇති කරුණු නම් වී ගොඩකින් ඉතා හොඳ වර්ගයේ බිත්තර වී ශාස්ත්‍රානුකූලව තෝරා ගැණීමට නොහැකිවීම හා ඉතා හොඳ බිත්තර වී තෝරාගැණීමට වෙන් වෙන් වශයෙන් වී වපුරා අස්වැන්න පරීක්‍ෂාකර බැලීමට ඇති දුෂ්කර තාවන්ය. සල්යත් යත් කවලම් බිත්තර වී වැපිරීමෙන් අස්වැන්න වැඩියෙන් ලැබෙන බිත්තර වී වර්ග සොයාගත නොහැක. තෝරා ගන්නාලද බිත්තර වී වැපිරීමෙන් මේ තාක් ලැබී තිබෙන දියුණුව සියයකට විස්සකට වැඩි නොවේ. එක වරක් වී වැපිරීමෙන් ඉඩමෙන් ස්වභාවික වශයෙන් ලැබෙන වෘක්‍ෂාහාරය ඒ වරටම වියදම් වන්නේ නම් සුදුසු පෝර වර්ග නොයොදා ඉඩමෙන් අධික අස්වැන්න ලබාගත නොහැක. බිත්තර වී කළට වෙලාවට සපයා ගැණීමට බාධාවන මුදල් සහ කුලිකරුවන් නොලැබීම සහ වැඩකිරීමේ පිළිවෙළක් ඇතිකර ගැණීමේ අපහසුකම යනාදි කරුණු එක්තරා ප්‍රමාණයකට සපයාගතහැකි නිසා මේ පත්‍රිකාවේ ඒ ගැණ විස්තර දැක්වීමට අදහස් නොකරමි.

**ගොවිතැන් ක්‍රම**:—ගොවිතැන් ක්‍රම අතුරෙන් දැනට සුදුසුයයි ප්‍රත්‍යක්‍ෂ වීතිබෙන ක්‍රම නම් මුලින්ම ඉඩම හොඳින් සකස් කිරීම, වල් පැළ උදුරා ශුද්ධ කිරීම අතින් වී ඉස වැපිරීම වෙනුවට පැළ සිටුවා වැපිරීම සහ පෝර කිරීමද වෙත්. නගුල් සහ දැති පෝරු ගවයින් ලවා ඉඩමේ ඇද්දවීමෙන් ප්‍රථමයෙන්ම ඉඩම හොඳින් සකස්කරගත හැකිවේ ගොවි කර්මෝපකරණ හා ගවයන් සොයාගැනීමට මුදල් අවශ්‍යයයි. මීට බාධක හේතුනම් ප්‍රධාන වශයෙන් මුදල් ණයට ගැණීම හෝ සෑහෙන කොන්දේසිපිට මුදල් ලබාගැණීමදවේ සමහර ස්ථානවලදී ගවයින්ට තණකොළ සොයා ගැණීමේ දුෂ්කර තාවයත් බාධාවක් වන්නේය.

වල් පැළෑටි උදුරා ඉඩම ශුද්ධකිරීමෙන් අස්වැන්නේ සතුටුදායක දියුණුවක් ඇතිවනබව පෙන්නුම් කරනලදී. අනුරාධ පුරයේ 100ට 36ක දියුණුවක් ඇතිවී තිබේ. සාමාන්‍ය වශයෙන් මෙයින් ඇතිවන දියුණුව 100ට 20ටත් 25ටත් අතරේ ප්‍රමාණයක්වේ. ගෙදර උදවිය ලවා වැඩකරවා ගැණීමෙන් වල් පැළ ඉදිරීමට යන වියදම අඩුකරගත හැකිවේ. මුදල් ගෙවා මේ වැඩේ කරවාගැනීමට අක්කරයකට

රුපියල් 12 කට වඩා වියදම් නොවේ. මෙයින් අක්කරයකින් ලැබෙන අස්වැන්නේ දියුණුව බුසල් 5කට 6කට අඩු නොවේ. එය බුසලක් රුපියල් 2/50 ගණනේ රුපියල් 12/50 ටත් 15 ටත් අතරේ ගණනක් වේ.

එසේ හෙයින් මේ මුළු ලාභයම ගොවියාට ලැබෙන්නේ නම් වල් පැලෑටි ඉදිරීම ප්‍රයෝජනවත් වන්නේය. ලංකාවේ ගොවීන් වැඩිපුරම දෙකෙන් කොටසට කුඹුරු වැඩ කරන නිසා ඒ ලාභයෙන් කොටසක් ඉඩම් හිමියාට අත්වන්නේය. කිසි වෙහෙස මහන්සියක් නොවී ඉඩම් හිමියන්ට මේ ලාභය ලැබීම අසාධාරණ බැව් කල්පනාකරන ඇතැම් ගොවීහු වතුවලහෝ පාරවල කුළීවැඩට යත්. මේතැන් වලදී ඔවුන්ට ඔවුන්ගේ වෙහෙස මහන්සියේ තරමට කුළිය ලැබේ. ලංකාවේ බොහෝ පළාත්වල ඉඩම් බදුදෙන්නේ මේ ක්‍රමයට නිසා එය ගොවිතැනේ දියුණුව ට බාධාවන එක් හේතුවකි.

ගොයම් පැල සිටුවා ගොවිතැන් කිරීමේ ක්‍රමයෙන් අස්වැන්නේ අධිකත්වයක් ඇතිවනබව නිසැකය. හයමාසයකට වපුරණ වීවගී පැලසිටුවා වැපිරීමෙන් අනුරාධ පුර පළාතේ කුඹුරුවලින් ලැබීතිබෙන අස්වැන්නේ දියුණුව සියයට තිහකි. මේ අත්හදා බැලීම ගැන 1927 තේ අවුරුද්දේ ජූලයි මසට නිකුත්කරනලද ඉංග්‍රීසි කෘෂිකර්ම සඟරාවේ සම්පූර්ණ විස්තර දක්වා තිබේ. මේ ක්‍රමයට වී වැපිරීමෙන් වියදම් වන මුදලට වඩා අස්වැන්න ලැබෙන බව පෙනීයයි. නියම වශයෙන් වියදම් වන මුදලමෙන් දෙගුණයකටත් වඩා අස්වැන්න ලැබිය යුතුයි.

ගොයම් පැළ සිටුවා වැපිරීමේ ක්‍රමය භාවිතාත්වයට පැමිණවීමට බාධා දෙකක් තිබේ. එනම් පැළ සිටුවන කාලයේදී වැසි වතුර හෝ ජල සම්පාදනය නොලැබීම හා ලාභයෙන් දෙකෙන් කොටසක් ඉඩම් හිමියාට නිරපරාධයේ අයිතිවන පරිදි ඉඩම් බදුදීමද වෙත්. වැසි වතුරෙන් පමණක් වී වපුරණ තන්හි අවුරුද්දේ ප්‍රථම භාගයේදී ලැබෙන වර්ෂාකාලයේ බිත්තර වී අතින් ඉස වපුරා ප්‍රයෝජන නොගත් නොත් එය අනතුරුදායක විය හැක.

කුඹුරුවල පෝරවගී යෙදීමෙන් ලැබෙන අස්වැන්නේ දියුණුව සම්බන්ධයෙන් වැඩි ශාස්ත්‍රානුකූල සාක්ෂියක් ඇත්තේ නැත. නමුත් බොහෝ ගොවීන්ට ගොම පෝර, කොළ සහ ඇටකුඩුවල අගනාකම අවබෝධවී තිබේ. මේගැන විශ්වාසකට යුතු කරුණු සොයා බැලීමට පරීක්ෂණ ආරම්භ කර තිබේ. නමුත් අස්වැන්නෙන් දෙකෙන් කොටසක් ඉඩම් හිමියාගේ සාක්කුවට යන නිසා පෝරකිරීම සඳහා වැඩි පුර වියදමක් දැරීමට ගොවීහු උනන්දුවක් නොදක්වත්.

දියුණු ක්‍රමවලට අනුව ගොවිතැන් කිරීමට ඇති බාධාවල් නම් ප්‍රධාන වශයෙන් ඉඩම් බදුගැණුමේ පිළිවෙල හා සැහෙන පොලියකට ණයට ගැණීමේ අපහසුකමද වෙත්. සමහර පළාත්වල ජල සම්පාදනය නිසි පරිදි නොලැබීමත් බාධාවක් බව පෙණේ. මේ සම්බන්ධයෙන් ගොවීන් අතර පවතින පැරණි අදහස් වෙනස් නො කිරීමත් බාධාවක් වනනමුත් කල් යත්යත් එය නැතිකරගත හැකියයි මගේ කල්පනාවයි.

## කුඹුරු කැබලිවල ප්‍රමාණය.

ලංකාවේ එකළුක පළාත්වල එක ගොවියෙකු විසින් වී වපුරණ කුඹුරු කැබැල්ලක ප්‍රමාණය දක්වන ගණන් ලේඛනාදිය තවම ලබාගන්ට නොහැකිවිය. නමුත්

සාමාන්‍යයෙන් එය ඉතා කුඩා බවට අනුමානයක් නැත. සාමාන්‍ය ඉඩමක ප්‍රමාණය මෙහි පහත දැක්වේ. එනම් පේරදෙනියේ හා ඒ අසල පළාත්වල අක්කරයේ සිට අක්කර දෙක දක්වාද, යාපනයේ අක්කරයේ සිට අක්කර 1½ දක්වාද, මඩකලපුවේ මිනිසුන් 4 දෙනෙක් එකතුවී අක්කර 25 ක්ද, තිස්සමහරාමයේ අක්කර 3 නේ සිට 4 දක්වාද, වැලිගම අක්කර 1½ රේ සට 2½ දක්වාද, අනුරාධපුරයේ අක්කර 3 ක් ද වෙත්. ලංකාවේ එක ගොවියෙකු විසින් වපුරණ කුඹුරක මධ්‍යස්ථ ප්‍රමාණය අක්කර දෙකකට හෝ තුනකට වැඩිවීම අනුමාන සහිත කාරණයකි. මේ ප්‍රමාණය ජපන් රටේ එක ගොවියෙකු විසින් වපුරණ කුඹුරක ප්‍රමාණය හා බොහෝ සේ සමාණ වන්නේය. ජපන් රටේ ගොවීන්ට අක්කර දෙකේ කුඹුරු ගැන කිරිං ‡ සඳහන්කර තිබේ. ඔව්හු උදේ සිට රෑවනතුරු වැඩ කරත් එක එක ගොයම් පැළයට දියාරු පෝර වගී ඔව්හු යොදත්. "ඩාර්ලිං" * කියා තිබෙන හැටියට ඔව්හු "සේද පණුවන් ඇතිකරමින් කුඹුරේම කාලය ගතකරත්". ජපන් රටේ මේ ගොවිතැන් කිරීමේ ක්‍රමයෙන් පෙනීයන්නේ මරට ගොවීන් මෙරට ගොවීන්ට වඩා පහත් ජීවිතයක් ගතකරන බවයි.

බුරුම රටේ මීට බොහෝසේ වෙනස්ය. පහත බුරුමේ එක ගොවියෙක් අක්කර 25 හේ සිට 40 දක්වා ලොකු කුඹුරක් වපුරයි. උඩ බුරුමේ කුඹුරක ප්‍රමාණය අක්කර හතක් පමණ වේ.

ලංකාවේ පවතින ක්‍රමය නම් අක්කර දෙකක හෝ තුනක කුඹුරක් එක ගොවියෙකු විසින් වැපිරීම කුඩා වැඩට වඩා උතුම්යයි ලංකාවාසීහු කල්පනා කරත්. තවද එයින් ගොවීන්ට මහාජනයාගේ වැඩි සැලකීමක් ඇතිවන බවද විශ්වාස කරත්. මොවුන් තුළ මේ අදහස් පවතින තුරුම යටකී ගොවිතැන් ක්‍රමයත් වෙනස් නොව පවතිනවා ඇත. සමහර පළාත්වල කුඹුරු ඉඩම් ලබාගැණීමට තිබෙන උනන්දුව කෙතරම්ද කීවොත් ඇතැම් ගොවියෝ ඉඩම් හිමියන්ට සාමාන්‍ය බිං අඳයට වඩා වැඩි සැළකීමක් මුදලින් කරත්. රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් හිමියා සාමාන්‍ය බිංඅඳය හැර වැඩිපුර බද්දක් අයකරයි. මේබද්ද "මඩරණ" ‡ යන නමින් ප්‍රකටයි. කුඹුරේ සරුගතියේ හැටියට බද්ද වෙනස් වන්නේය. මේහැර ඔවුනොවුන්ගේ අඳ කොටසත් ගන්නේය. ලංකාවේ වී ගොවිතැනට සුදුසු ඉඩම් ලබාගතහැක අභිනව වාරිමාර්ග විවෘත කිරීමෙන් හා පුරාණ වැව් අමුණු ආදිය ප්‍රතිසංස්කරණය කිරීමෙන් බොහෝ ඉඩම්වල වීගොවිතැන්කළ හැකිවන්නේය අනුරාධපුරය වැනි ඉඩම් පහසුවෙන් ගතහැකි පළාත්වල වී ගොවිතැනට ඇති බාධාවල් අතුරෙන් සමහරක් නම් මැලේරියා උණ පැතීම සහ මුදල් හදල් ලාභ අඳමකට සොයාගැණීමේ දුෂ්කරතාවයද වන්නේය.

**කෘමි සතුන් හා පැළ රෝග** :—වී ගොවිතැනට ගණනක් නැති කෘමි සතුන්ගේ හා පැළ රෝගවලින් හාණී පැමිණේ. එයින් අස්වැන්නද බොහෝසේ අඩුවන්නේය. මින් සමහරක් නම් පක්ෂීන්ගෙන් වන රෝග, ගොයම් මැස්සා බෝවීම, සාද පණුවන් බෝවීම, පුස් රෝග, ගොඩ කකුළුවන්, වල් හරකුන් හා වෙනත් වල්

‡ ජී. කිරිං:—බටහිර ඉන්දියාවේ කෘෂිකර්මාන්තය.

* ඇම්. ඇල්. ඩාර්ලින්:—පොහොසත්වූ ණයවී සිටින පන්ජාබ් දේශයේ ගොවියා.

‡ මදනායකගේ "රත්නපුර දිස්ත්‍රික්කයේ වීගොවිතැනට ඉඩම් බදුදීමේ ක්‍රමය" ට්‍රොපිකල් ඇග්රිකල්චරිස්ට් LXVIII.

සතුන්ගෙන් වන උපද්‍රවන්ද වෙත්. වී ගොඩ ගැසුවාට පසු කාවුන්ගෙන් හා ගුල්ලන් ගෙන් හානි පැමිණේ. සුදුසු වැට කටු බැඳීමෙන් වල් සතුන් ගෙන් වන හානි හුඟක් දුරට වළක්වාගත හැක. වැඩි බලවත්තුවූ හානියක් සිදුකරණ ගොඩ කකුළුවන් උගුල් ඇටවීමෙන් අල්ලාගත හැක. ඇතැම් කෘමි රෝග මැඩ පවත්වා ගැණීමට ප්‍රතිකර්ම තිබේ.

**මුදල් පහසු ක්‍රමයකට ණයට ගැණීම** :—මේ ගැණ මිට ඉහතින් සඳහන් කරනලදී. ඒනිසා දැනට ඒ ගැණ කියයුතුව තිබෙන්නේ ණය දෙන සමූපකාර සමිති පිහිටුවීම ගොවියාට ආධාර පිණිස වනබව පමණකි.

**ද්‍රව්‍ය විකුණාගැණීම** :—මේ කාලයේ ලංකාව සම්බන්ධයෙන් ද්‍රව්‍ය විකුණාගැණීම බන්ධයෙන් වෙළඳම් කිරීම පිළිබඳ ප්‍රශ්ණය වැඩි භාරධූර ප්‍රශ්ණයක් නොවේ. වැඩි වශයෙන් වී ලැබෙන්ට පටන්ගත් පසු මේ වැදගත් ප්‍රශ්ණ විසඳීමට සමූපකාර සමිතිවලට මැදහත්වී ක්‍රියා කිරිමට තව ප්‍රස්තාවක් ලැබෙන්නේය.

**කාල ගුණය හා කුලීකාරුවන් සපයාගැණීම** :—බාධක හේතුවක් වශයෙන් කාල ගුණය දෙවිධියකට ක්‍රියා කෙරේ. වැසී ඵල හොඳින් පවතිනවිට හෝ වෙවා අඩුවෙන් පවතිනවිට හෝ වේවා එක් අතකින් වී ගොවිතැනට යොදන භූමි ප්‍රමාණය වැසි ඵලවලට අනුව අඩු වැඩි වන්නේය. (අධික වර්ෂාව පවතිනවිට පැල සිටුවා ගොවිතැන් කිරීම නොහැකිවේ ) අනිත් අතට ඒ අනුවම ගොවියාටත් ඔහුගේ සැප හෝ දුක් සිදුවන්නේය. වර්ෂාව සම්බන්ධයෙන් (වැහි නැතිකමින්) පසුගිය මෝසමේ උතුරු පළාතට හා උතුරු මධ්‍යම පළාත්වලට සිදුවූ බලවත් විපත අපි සියලු දෙනාම දනිමු.

ඇතැම් දිසත්‍රික්කවල කාල ගුණය හේතුකොට ගෙණ දක්ෂ ලෙස තමාගේ වැඩ කරගැණීමට ගොවියා අපොහොසත් වන්නේය. පන්ජාබ් රට ගැණ කැල්වට් මහතා මෙසේ කියා තිබේ "මෙ රටේ මිනිස්සු වැඩි වෙහෙස මහන්සිදරා වැඩකොට සැපදායක ජීවිතයක් ගතකිරීමට සතුටුවෙත්." ලංකාවේ ඇතැම් ගොවියෝද මේ විධියට ක්‍රියාකරත්. නමු වැඩි වශයෙන් ගොවීන් වෙහෙස මහන්සි දරා වැඩ නොකරන්නේ ගැහෙණ උණ රෝගයෙන් ඔවුන්ගේ ශක්තිය උරාගත තිබෙන ප්‍රදෙශවලය.

ඇතැම් දිසත්‍රික්කවල කුඹුරුවල වල් පැල උදුරා කුඹුරු තෙලා වැඩ කිරීමට හා පැල සිටුවා ගොවිතැන් කිරීමටද කම්කරුවන් සැහෙන තරමක් සොයාගන්ට නොහැකිබව පෙනේ. නමුත් මේ වැඩකිරීමට පලපුරුද්දක් ඇති බවලතුන් සිටින පළාත්වල මෙයින් දුෂ්කර තාවයක් නොවේ. නිදර්ශන වශයෙන් බුරුම රට හා ලංකාවේ මධ්‍යම පළාතේ ඇතැම් පෙදෙසේද වෙත්.

**ඉඩම් බදු ගැනීමේ ක්‍රමය** :—ලංකාවේ ගොවිතැනට ඉඩම් බදුදීමේ ප්‍රධාන ක්‍රම දෙකක් තිබේ. ඉන් එකක් නම් නියම බද්දකට ඉඩමක් ගැනීමය. අනික නම් අඳේට වැඩ කිරීමට ඉඩම් ලබාගැණීමය, වැඩි වශයෙන් කුඹුරු බදු ගන්නේ ඉඩම් හිමියාට අඳකොටස ගෙවීමටය. අළුත් ඉඩම්වල මේ කොටස $\frac{1}{4}$න් කොටසේ සිට 2/3 කොටස දක්වා වෙනස්වේ. ඉඩම් හිමියාට මේ කොටස් ගෙවන්නේ සියලු වියහියදම් හැර ඉතුරුවන අස්වැන්නෙන්ය. ගොවියාට දැරීමට තිබෙන වියදම් නම් බිත්තර වී සපයාගැනීමට දෙන කොටසද, දිය බද්ද, වෙල්විදානෙගෙ ගාස්තුව

හා ගොයම් පෑගීමට දෙන කොටසද වෙත් සාමාන්‍යයෙන් ඉඩම් හිමියාට අයිති කොටස දෙකෙන් පංගුවකි. යාපනේ හා මඩකලපුවේ නියම බද්දක් තිබේ· යාපනේ ඉඩම් බදුගත් අය ගෙවන්නේ ලාච්චම් එකකට බුසලක් හෝ අක්කරයකට බුසල් 24කි මෙය පහළ බුරුමේ ගෙවන ගණන වාගේ දෙගුණයක් පමණවේ. මඩකලපුවේ ගොවීන් 4 දෙනෙක් එකතුවී අක්කර 25ක කුඹුරක් වපුරා අක්කර 2½ක අස්වැන්න ගොවියාට වෙන්කරත්. ඔව්හු ඉඩම් හමියාට වෙනත් වැඩ කරත්. තිස්සමහරාමේ නියම බදු ක්‍රමයක් ඇතිබව පෙනියන නමුත් බදු මුදල ගෙවන්නේ ප්‍රධාන බදුකාරයා විසිනි. (අක්කරයකට රුපියල් 5සේ සිට 6 දක්වා ගෙවනු ලැබේ. ප්‍රධාන බදුකාරයා (ගම් භාරයා) යටතේ වැඩකරණ ගොවියා දෙකෙන් කොටසට වැඩකරයි. ප්‍රධාන බදුකාරයාගෙන් ඉඩමක් දෙවෙනි බද්දකට ගන්ට ලැබෙන්නේ වැපිරීමට උවමනා බිත්තර වී හා කෑමට උවමනා වී හාල් ආදිය සුදුසු පොලියකට ඔහුගෙන් ගන්ට කැමතිවන ගොවීන්ට පමණකි. අස්වැන්නෙන් කොටසක් අයකරන්නේ ඉඩම් හිමියා විසින් පමණක් නොවේ සමහරවිට අනිත් ශාස්ත්‍ර ආදියටත් මුළු අස්වැන්නෙන් කොටස් ගෙවීමට තිබේ. එනම්: දියබද්දට 1/10න් කොටසක්ද ගොයම් පෑගීමට 1/10 සිට 1/20 දක්වා කොටසක්ද, වෙල් විදානෙට 1/48න් කොටසක්ද වෙත්. ඉහතකී කොටස් නිදර්ශනයක් වශයෙන් දක්වන ලද්දේ වීනමුත් ඒවා නොයෙක්විට වෙනස්වේ. අදේට ගොවිතැන් කරණ ගොවිහු හොඳ අස්වැන්නක් උපදවා ගැණීමට වැඩි උනන්දුවක් නොදක්වත්. මක්නිසාදයතහොත් මුදල් වැඩියෙන් වියදම් කිරීමෙන් හෝ කුලීකරුවන් වැඩි ගණනක් යොදා වැඩ කිරීමෙන් හෝ ලැබෙන වැඩිපුර අස්වැන්නෙන් දෙකෙන් කොටසක්වත් ඔහුට නොලැබෙන හෙයිනි. නිදර්ශනයක් දක්වමි. වල්පැළ උදුරා ගොවිතැන් කිරීමෙන් වී බුසල් හයක් ලැබෙන ලාභයක් පෙණේ එසේ නොකොට ගොවිතැන් කිරීමෙන් ලැබෙන්නේ බුසල් තුන නම් ගොවියාට ලාභයක් නැත්තේය. යම් කිසි මෝසමක යහපත් කාලගුණයක් නොලැබීමෙන් ගොයම් කොටසක් හෝ සම්පූර්ණයෙන් පාළු වුනිනම් අදේට ගොවිතැන් කරණ නියම බද්දක් ගෙවන්ට නැති නිසා වැඩි පාඩුවක් නොවන්නේය. එය එසේමැයි. නමුත් මුළු පළාතේම ගොයම පාළුවූ විට යාපනේ පවතින සිරිත අනුගමනය කළහැකිවේ. ඒ පළාතේ ගොයම සම්පූර්ණයෙන් පාළුවූවිට බද්දක් අයනොකරයි.

මේ වාක්‍ය කියවීමට මට ලැබී තිබෙන සුළු කාලය ඇතුළතදී වී ගොවිතැනේ දියුණුවට ඇතිවන බාධක හේතූන් පිළිබඳ මීට වඩා යමක් කීමට ඉඩක් නැත. මාවිසින් ඉදිරිපත්කරනලද කාරණා ගැණත් සම්පූර්ණ විස්තරයක් කරන්ට ඉඩ ලැබුනේ නැත. ඉඩම් බදුගැනීම සම්බන්ධයෙන් මීට පසු කියවනු ලබන පත්‍රිකාවේ සම්පූර්ණ විස්තරයක් ඇතිවේයයි මම බලාපොරොත්තුවෙමි. වී ගොවිතැනේ දියුණුවක් ලබාගැණීමට ඇති මාර්ග නම් නියම බද්දක් අයකිරීම බදු මුදල් නොවරදවා ගෙවීමට ඇප ගැනීම බදුකාරයා විසින් ඉඩම දියුණු කිරීමට කරන වැඩ වලට වන්දි ගෙවීමද වෙත්.